# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අනධ්‍යයන තනතුරු ඇබෑර්තු - 2026
## විස්තරාත්මක තොරතුරු පත්‍රිකාව

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් අනධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2026.08.10 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට පමණි.

### 1. නේවාසිකාගාර උප පාලක II ශ්‍රේණිය (පූර්ණ කාලීන)

- **සුදුසුකම්** :
  පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

- **තේරීම** : සම්මුඛ පරීක්ෂණයක් මගින්

- **වැටුප් පරිමාණය**: UMN 3(II), - රු. 71,365-18×1190 – 92,785 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

- **සේවා කොන්දේසි** - පූර්ණ කාලීන නේවාසිකාගාර උප පාලකවරු තමා අනුයුක්ත කරනු ලබන නේවාසිකාගාරය තුළ රැඳී සිටිය යුතු ය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 බලන්න.

## 2. විගණන සහකාර II ශ්‍රේණිය

- **සුදුසුකම් :**

**1.** අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

I. සිංහල භාෂාව/දෙමළ භාෂාව
II. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
III. ගණිතය

**සහ**

**2.** අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (අ.පො.ස. (උසස් පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම)

**සහ**

**3. තනතුරට විශේෂ වූ සුදුසුකම්**

(අ). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මූලික (Preliminary) අදියර / ආවාසරික (Licentiate) I අදියර/ පදනම් (Foundation) අදියර / CAB I / විධායක අදියර (Executive) සමත් වීම හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් ලබා තිබීම

**හෝ**

(ආ). වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පදනම් අදියර සමත් වීම (CIMA)

**හෝ**

(ඇ). ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත් වීම. (HNDA)

**හෝ**

(ඈ). ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

**4.** විගණන කටයුතු පිළිබඳ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් ලබා තිබීම.

පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් (Computer Applications) සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාල සීමාවක් සඳහා පිළිගත හැකි සුදුසුකම් ලබා ගත් අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**සටහන :**

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ගිණුම්කරණය/ විගණන පිළිබඳ විශ්වවිද්‍යාල පද්ධතියේ/ රාජ්‍ය ආයතනවල / පිළිගත් පුද්ගලික ආයතනවල ලද පළපුරුද්ද ඉහත අංක 4හි සඳහන් විගණනය පිළිබඳ පළපුරුද්ද සඳහා සැලකිල්ලට ගනු ලැබේ. (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පමණි)

- **තේරීම** : සම්මුඛ පරීක්ෂණයක් මගින්
- **වැටුප් පරිමාණය**: U-MN 2(II) - රු. 61,275-18x890-77,295 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2022 බලන්න.

## 3. <u>කළමනාකරණ සහකාර III ශ්‍රේණිය</u>

- **සුදුසුකම් :**

<u>බාහිර අපේක්ෂකයින් සඳහා</u>

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.
   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

**සහ**

2. අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (අ.පො.ස. (උසස් පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

අ). පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

**සහ**

ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම.

**සටහන :**

a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
b. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
c. මනා චරිතයක් තිබිය යුතු ය.

<u>අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා</u>
<u>(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පමණි)</u>

1. වාර දෙකකට (02) නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන දෙකක්වත් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකට (06) නොඅඩු සංඛ්‍යාවකින් සමත් වී තිබිය යුතුය.

**සහ**

2. U-PL වැටුප් කේතය මගින් දක්වා ඇති වැටුප් පරිමාණයක් සහිත ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක් දැරීම සහ ප්‍රාථමික මට්ටමේ (U-PL) තනතුරක ස්ථිර කර තිබිය යුතුය.

**සහ**

3. අදාළ දිනට පෙර ප්‍රාථමික මට්ටමේ (U-PL වැටුප් කාණ්ඩයේ) ස්ථිර පත්වීමක අවම වශයෙන් වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
- **තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්
- **වැටුප් පරිමාණය :** UMN 1(III), - රු. 49,475-17×540 – 58,655 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018 බලන්න.

## 4. <u>රියදුරු III ශ්‍රේණිය</u>

- **සුදුසුකම් :**

<u>බාහිර අපේක්ෂකයින් සඳහා</u>

(i) උපරිම වාර දෙකක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සමත් වී තිබිය යුතු අතර, එම විෂයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.

සහ

(ii) බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු ය.

<u>අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා</u>
<u>(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පමණි)</u>

(i). බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද.

සහ

(iii) ප්‍රාථමික අර්ධ කුසලතා (U-PL 2) හෝ ප්‍රාථමික නුපුහුණු (U-PL 1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර වර්තමාන තනතුරේ ස්ථිර කර තිබීම.

- **තේරීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.
- **වැටුප් පරිමාණය**: UPL 3(III), - රු. 48,005-16×490 – 55,845 (මාසික) (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**සටහන:** සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් ශාරීරික හා මානසික මට්ටමකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024 බලන්න.

## 5. <u>විදුලි කාර්මික III ශ්‍රේණිය</u>

- **සුදුසුකම් :**

<u>බාහිර අපේක්ෂකයින් සඳහා</u>

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් තනතුරේ කාර්යයට අදාළව ලබාගෙන තිබීම.

<u>**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා**</u>
<u>**(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පමණි)**</u>

1. වර්තමාන තනතුරේ ස්ථිර කර ඇති සහ ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා ඇති ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) සේවකයින්.

හෝ

2. ප්‍රාථමික අර්ධ කුසලතා (U-PL 2) හෝ ප්‍රාථමික නුපුහුණු (U-PL 1) කාණ්ඩයේ තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ ස්ථිර කර ඇති සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 ට නොඅඩු කුසලතාවක් සහිත බව වෘත්තීය පරීක්ෂණයකින් ඔප්පු කර ඇති අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති සේවකයින්

- **තේරීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

- **වැටුප් පරිමාණය**: UPL 3(III), - රු. 48,005-16×490 – 55,845 (මාසික) (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**සටහන:** සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් ශාරීරික හා මානසික මට්ටමකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024 බලන්න.

## 6. <u>වැඩ සහයක III ශ්‍රේණිය</u>

- **සුදුසුකම් :**
  වාර දෙකකට (02) නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන දෙකක්වත් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකට (06) නොඅඩු සංඛ්‍යාවකින් සමත් වී තිබිය යුතුය.

- **තේරීම** : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

- **වැටුප් පරිමාණය**: UPL 1(III), - රු. 42,775-16×450 – 49,975 (මාසික) (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

**සටහන:** සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් ශාරීරික හා මානසික මට්ටමකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024 බලන්න.

<u>ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ</u>

- තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15% මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3% මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

- පාරිතෝෂික දීමනාව

<u>අනෙකුත් ප්‍රතිලාභ</u>

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව හිමි අනෙකුත් දීමනා
- විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

**<u>අයදුම් කළ යුතු ආකාරය:</u>**

අයදුම්කරුවන්ට තනතුරට අදාළ සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ හැකි ය.

**සෑම අයදුම්කරුවෙකුම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන පදනම මත රු. 1000.00 ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය.** මෙම මුදල් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ අංක 711201 දරන ගිණුමට බැර කළ යුතු ය. මුදල් තැන්පත් කළ රිසිට් පත අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය. අපේක්ෂකයා සතුව රිසිට්පතේ පිටපතක් තබා ගැනීම යෝග්‍ය වේ. **අදාළ රිසිට්පත අමුණා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ.**

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර 2026.08.10 දින හෝ ඊට පෙර, "**නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 37, මොරගහහේන පාර, පිට්පන නගරය, හෝමාගම.**" යන ලිපිනය වෙත **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු ය. ලියාපදිංචි තැපැල් කුවිත්තාන්සියේ පිටපතක් ලිපි කවරයේ අමුණා එවිය යුතු ය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 37, මොරගහහේන පාර,**
**පිට්පන නගරය,**
**හෝමාගම.**
**2026.07.08**